

# 2017

# අයවැය ලේඛනය

# வரவு செலவுத் திட்டம்

# BUDGET STATEMENT

## යටියන්තොට ප්‍රාදේශීය සභාව

## எட்டியாந்தோட்டை பிரதேச சபை

## YATIYANTOTA PRADESHIYA SABHAWA

# වර්ෂ 2017 සඳහා වූ
# යටියන්තොට ප්‍රාදේශීය සභාවේ
# *අයවැය ලේඛනය*

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු 168(1) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව යටියන්තොට ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය සහ කර්තව්‍යය ඉටුකරන ලේකම් ආර්.එම්.ඒ.රත්නායක වන මම 2016.12.14 දින පවත්වන ලද කළමණාකරණ කමිටු නිර්දේශයට අනුව තීරණ අංක 1393 යටතේ මෙම අයවැය ලේඛන 2017 අයවැය ලේඛනය ලෙස සලකා කටයුතු කරන ලෙෂ මෙයින් දන්වා සිටිමි.**

**ආර්.එම්.ඒ.රත්නායක**

**ලේකම්**

**යටියන්තොට ප්‍රාදේශීය සභාව**

# යටියන්තොට ප්‍රාදේශිය සභාව 2017වර්ෂයේ අයවැය ලේඛනය


| පටුන | පිටුව |
|---|---|
| (අ) තොරතුරු හා වාර්තා | |
| 1. මෙහෙවර ප්‍රකාශය | 01 |
| 2. සංස්ථාපනය | 02 |
| 3. හැදින්වීම | 03 |
| 4. ලේකම්තුමියගේ අයවැය පණිවිඩය | 04 |
| 5. අය වැය ප්‍රතිපත්ති ප්‍රකාශය | 05 -07 |
| 6. ලේකම් තුමියගෙ අයවැය වාර්තාව | 08-10 |
| 7. බල ප්‍රදේශයේ සිතියම | 11 |
| 8. පොදු සංඛ්‍යා ලේඛන තොරතුරු | 12-14 |
| 9. මිනිස් බල සාරාංශය | 15 |
| 10. අනුමැතියට යවා ඇතිතනතුරු | 16 |
| 11. කාර්ය මණ්ඩල සංවිධාන සටහන | 17 |
| 12. පුනරාවර්තන ආදායම් විශ්ලේෂණ තීරු සටහන | 18 |
| 13. පුනරාවර්තන වියදම් විශ්ලේෂණ තීරු සටහන | 19 |
| 14. පුනරාවර්තන වියදම් සාරාංශය | 20 |
| 15. පුනරාවර්ථන ආදායම් සාරාංශය | 21 |
| ආ.) පුනරාවර්තන අයවැය වාර්තා. | |
| **වැඩසටහන 01 - පොදු පරිපාලනය** | |
| පුනරාවර්තන ආදායම් ප්‍රබවයන් හා ඇස්තමේන්තුව | 22-25 |
| පුනරාවර්තන වියදම් ප්‍රබවයන් හා ඇස්තමේන්තුව | 26 -30 |
| **වැඩසටහන 02 - සෞඛ්‍ය සේවා** | |
| පුනරාවර්තන ආදායම් ඇස්තමේන්තු වැඩසටහන | 31-37 |
| පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු වැඩසටහන | 38-41 |
| **වැඩසටහන 03 - භෞතික සැළසුම්** | |
| පුනරාවර්තන ආදායම් ඇස්තමේන්තු වැඩසටහන | 42-44 |
| පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු වැඩසටහන | 45 -46 |
| **වැඩසටහන 04 - ජල සේවා** | |
| පුනරාවර්තන ආදායම් ඇස්තමේන්තු වැඩසටහන | 47-48 |

**<u>වැඩසටහන 05 - මහජන උපයෝගී සේවා</u>**

පුනරාවර්තන ආදායම් ඇස්තමේන්තු වැඩසටහන 50-52

පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු වැඩසටහන 53-54

**<u>වැඩසටහන 06 - සුභ සාධක සේවා</u>**

පුනරාවර්තන ආදායම් ඇස්තමේන්තු වැඩසටහන 55-57

පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු වැඩසටහන 58-60

ප්‍රාග්ධන අයවැය සාරාංශය 61

ප්‍රාග්ධන ආදායම් ඇස්තමේන්තුව 62

ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුව 63

ප්‍රාග්ධන වියදම් සාරාංශය 64

සේවා නියුක්ති සාරාංශය වැඩසටහන - 01 65

සේවා නියුක්ති සාරාංශය වැඩසටහන - 02 66

සේවා නියුක්ති සාරාංශය වැඩසටහන - 03 67

සේවා නියුක්ති සාරාංශය වැඩසටහන - 04 68

සේවා නියුක්ති සාරාංශය වැඩසටහන - 05 69

සේවා නියුක්ති සාරාංශය වැඩසටහන - 06 70

අය ක්‍රම 71-72

# යටියන්තොට ප්‍රාදේශීය සභාවේ මෙහෙවර ප්‍රකාශය

ප්‍රදේශයේ ජනතා අවශ්‍යතාවයන් හා සම්පත් නිසි පරිදි හඳුනාගෙන පොදුජන අපේක්ෂාවන් මුදුන්පත් වන අයුරින් වඩා යහපත් කාර්යක්ෂම සාධාරණ සේවයක් කිරීමට කැපවීම අපගේ මෙහෙවර ප්‍රකාශයයි.



**අපේ අද දවස ඔබේ හෙට දවස වෙනුවෙනි.**

# යටියන්තොට ප්‍රාදේශීය සභාව සංස්ථාපනය

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව 1988.01.01 දින සිට යටියන්තොට ප්‍රාදේශීය සභාව නමින් මෙම සභාව සංස්ථාපනයකර ඇත.ඒවන විට බල ප්‍රදේශය වූයේ යටියන්තොට හා බුලත්කොහුපිටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වන අතර මන්ත්‍රි මණ්ඩල 22ක් විය.2006 .04.15 දින සිට බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කළ අතර යටියන්තොට ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය වනුයේ යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයයි.2011.03.28 දින සිට 2015 .05 .15 දින දක්වා මන්ත්‍රි මණ්ඩල 15 දෙනෙකුගෙන් යුත් පස්වන ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක විය

# හැඳින්වීම

දෙහිගම්පල කෝරලයේ සහ පහත බුලත්ගම ගම් සභාව , රුවන්වැල්ල/ යටියන්තොට යන මැතිවරණ කොට්ඨාශ අඩංගු වන සේ 1940 දශකයේ සිට පැවත එන්නකි. 1963.07.01 වෙනි දින සිට එකී ගම් සභාව, කොටස් කර යටියන්තොට සුළු නගර සභාව , රුවන්වැල්ල සුළු නගර සභාව , උඩුව පළාත් ගම් සභාව, කිතුල්ගල ගම් සභාව , මෙගොඩපත ගම් සභාව , එගොඩපත ගම් සභාව , වශයෙන් පළාත් පාලන ආයතන 06ක් පිහිටු වන ලදී.

ඒ අනුව පිහිටු වන ලද යටියන්තොට සුළු නගර සභාව 1981 ජූලි 01 වෙනි දින සිට කෑගල්ල දිස්ත්‍රික් සංවර්ධන සභාවේ යටියන්තොට උපකාර්යාලය බවට පත්විය.

අනතුරුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත අනුව 1988 ජනවාරි මස 01 වන දින සිට යටියන්තොට ප්‍රාදේශීය සභාව සංස්ථාපනය විය. පහත සඳහන් සංවර්ධන සභා උපකාර්යාලයන් යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් විය.

- උඩුව ගම් පළාත සංවර්ධන සභා කාර්යාලය
- කිතුල්ගල පළාත සංවර්ධන සභා උපකාර්යාලය.
- මෙගොඩපත පත්තු සංවර්ධන සභා උපකාර්යාලය.
- යටියන්තොට සංවර්ධන සභා උපකාර්යාලය.

1988.01.01 වෙනි දින සිට ආරම්භ වූ යටියන්තොට ප්‍රාදේශීය සභාව එදින සිට 1991.06.30 වෙනි දින දක්වා විශේෂ කොමසාරිස්වරුන් යටතේ පාලනය වූ අතර 1991.07.01 වෙනි දින සිට මහජන ඡන්දයෙන් තේරී පත් වූ මන්ත්‍රීවරුන් (22) විසි දෙදෙනෙකුගෙන් සමන්විත මන්ත්‍රී මණ්ඩලයක් යටතට පත් විය.

එය පළමු වන ප්‍රාදේශීය සභාවයි. එහි නිල කාලය අවසන් වූ පසු 1997 අප්‍රේල් මස 15 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි දෙවන ප්‍රාදේශීය සභාව ආරම්භ විය. අනතුරුව 2002.04.15 දින සිට තෙවන ප්‍රාදේශීය සභාව ආරම්භ වූ අතර මන්ත්‍රී මණ්ඩලය 22 විය.

2006.04.15 දින බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කල අතර ඉන් පසුව යටියන්තොට ප්‍රාදේශීය සභාවෙන් බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඉවත් විය. 2006.04.15 දින සිට යටියන්තොට ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය වනුයේ යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයයි. 2011.03.28 වන දින සිට මහජන ඡන්දයෙන් තේරී පත් වූ පහලොස් දෙනෙකුගෙන් සමන්විත පස්වන ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මකව පැවතිණි.2015.05.15 දින සිට ධුරකාලය අවසන් වීම නිසා මේවන තෙක් ප්‍රාදේශීය සභාවෙහි බලතල සහ කාර්යය ලේකම් වෙත පැවරී ඇත.

ආර්.එම්.ඒ.රත්නායක

ලේකම්

යටියන්තොට ප්‍රාදේශීය සභාව

# යටියන්තොට ප්‍රාදේශීය සභාව සංස්ථාපනය

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව 1988.01.01 දින සිට යටියන්තොට ප්‍රාදේශීය සභාව නමින් මෙම සභාව සංස්ථාපනයකර ඇත.ඒවන විට බල ප්‍රදේශය වූයේ යටියන්තොට හා බුලත්කොහුපිටිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වන අතර මන්ත්‍රී මණ්ඩල 22ක් විය.2006 .04.15 දින සිට බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කළ අතර යටියන්තොට ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය වනුයේ යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයයි.2011.03.28 දින සිට 2015 .05 .15 දින දක්වා මන්ත්‍රී මණ්ඩල 15 දෙනෙකුගෙන් යුත් පස්වන ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක විය

# හැඳින්වීම

දෙහිගම්පල කෝරලයේ සහ පහත බුලත්ගම ගම් සභාව , රුවන්වැල්ල/ යටියන්තොට යන මැතිවරණ කොට්ඨාශ අඩංගු වන සේ 1940 දශකයේ සිට පැවත එන්නකි. 196 3.07.01 වෙනි දින  සිට එකී ගම් සභාව, කොටස් කර යටියන්තොට සුළු නගර සභාව , රුවන්වැල්ල සුළු නගර සභාව , උඩුව පළාත් ගම් සභාව, කිතුල්ගල ගම් සභාව , මෙගොඩපත ගම් සභාව , එගොඩපත ගම් සභාව , වශයෙන් පළාත් පාලන ආයතන 06 ක් පිහිටුවන ලදී.

ඒ අනුව පිහිටු වන ලද යටියන්තොට සුළු නගර සභාව 1981 ජූලි 01 වෙනි දින සිට කැගල්ල දිස්ත්‍රික් සංවර්ධන සභාවේ යටියන්තොට උපකාර්යාලය බවට පත්විය.

අනතුරුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත අනුව 1988 ජනවාරි මස 01 වන දින සිට යටියන්තොට ප්‍රාදේශීය සභාව සංස්ථාපනය විය. පහත සඳහන් සංවර්ධන සභා උපකාර්යාලයන් යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් විය.

- උඩුව ගම් පළාත සංවර්ධන සභා කාර්යාලය
- කිතුල්ගල පළාත සංවර්ධන සභා උපකාර්යාලය.
- මෙගොඩපත පත්තු සංවර්ධන සභා උපකාර්යාලය.
- යටියන්තොට සංවර්ධන සභා උපකාර්යාලය.

1988.01.01 වෙනි දින සිට ආරම්භ වූ යටියන්තොට ප්‍රාදේශීය සභාව එදින සිට 1991.06 .30 වෙනි දින දක්වා විශේෂ කොමසාරිස්වරුන් යටතේ පාලනය වූ අතර 1991.07.01 වෙනි දින සිට මහජන ඡන්දයෙන් තේරී පත් වූ මන්ත්‍රීවරුන් (22) විසි දෙදෙනෙකුගෙන් සමන්විත මන්ත්‍රී මණ්ඩලයක් යටතට පත් විය.

එය පළමු වන ප්‍රාදේශීය සභාවයි. එහි  නිල කාලය අවසන් වූ පසු 1997 අප්‍රේල් මස 15 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි දෙවන ප්‍රාදේශීය සභාව ආරම්භ විය. අනතුරුව 2002.04.15 දින සිට තෙවන ප්‍රාදේශීය සභාව ආරම්භ වූ අතර මන්ත්‍රී මණ්ඩලය 22 විය.

2006 .04.15 දින බුලත්කොහුපිටිය ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කල අතර ඉන් පසුව යටියන්තොට ප්‍රාදේශීය සභාවෙන් බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඉවත් විය. 2006 .04.15 දින සිට යටියන්තොට ප්‍රාදේශීය සභාවේ  බල ප්‍රදේශය වනුයේ යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයයි. 2011.03.28 වන දින සිට මහජන ඡන්දයෙන් තේරී පත් වූ පහලොස් දෙනෙකුගෙන් සමන්විත පස්වන ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මකව පැවතිණි.2015 .05 .15 දින සිට ධූරකාලය අවසන් වීම නිසා මේවන තෙක් ප්‍රාදේශීය සභාවෙහි බලතල සහ කාර්යය ලේකම් වෙත පැවරී ඇත.

ආර්.එම්.ඒ.රත්නායක

ලේකම්

යටියන්තොට ප්‍රාදේශීය සභාව

# ලේකම්තුමියගේ 2017 අයවැය පණිවිඩය

# යටියන්තොට ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සංවර්ධනයේ ප්‍රමුඛතම ආයතනය වන යටියන්තොට ප්‍රාදේශිය සභාවේ 2017 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය ප්‍රාදේශිය සභා පනතේ 168 වන වගන්තිය ප්‍රකාරව පළාත් පාලන කළමනාකරණ ඒකකයේ මග පෙන්වීම අනුව සබරගමුව පළාත් පාලන අමාත්‍යංශයේ උපදෙස් හා නියමයන්ට අනුකූලව මෙසේ ඉදිරිපත් කරමි.

සෞඛ්‍යාරක්‍ෂිත බවින් පිරිපුන් පරපුරක් ඇති කිරීම මෙන්ම පොදු උපයෝගිතා සේවා සැපයීම තුලින් මහජන සුබ විහරණය ඇති කිරීමත් ගංවතුර හා නාය යෑම් වැඩි අවදානම් කලාපයක් වශයෙන් නිතර නිතර හානියට පත්වන මංමාවත් සංවර්ධනය මෙන්ම වැඩි දියුණු කිරීමටත් ක්‍රියා කරමි. එමෙන්ම ප්‍රාථමික අධ්‍යාපනය, මාතෘ හා ළමා සෞඛ්‍ය කටයුතු වැඩි දියුණු කිරීම, වසංගත රෝග පාලනය, ළමා කාන්තා හා වැඩිහිටි සංවර්ධන කටයුතු කිරීමටත් සංස්කෘතිය කලාව වැනි අංශයන්ගේ ප්‍රවර්ධනයක් ඇති කිරීමටත් කටයුතු කරමි. එමෙන්ම පරිසරයේ තිරසාර පැවැත්මට හානි නොවන අයුරින් ප්‍රදේශයේ සංවර්ධන කටයුතු කිරීමටත් ක්‍රියා කරමි.

නිවැරදි මගකට පිවිසෙමින් ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සාර්ථක අන්දමින් කිරීමට නිරන්තර උපදෙස් ලබා දෙමින් අප දිරිමත් කරන සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍ය ගරු මහීපාල හේරත් මැතිතුමා, ඇතුළු කාර්ය මණ්ඩලයත්, සබරගමුව පළාත් පාලන කොමසාරිස්තුමිය ඩී. ඩබ්ලිව්. සුසිලා රාජපක්‍ෂ මහත්මියත්, නිරන්තරයෙන් ආයතනය හා බැදෙමින්, උපදෙස් හා අනුශාසනා ලබා දෙමින් අප ආයතන කටයුතු නිසි මගට යොමු කිරීමට උත්සාහ දරණ කෑගල්ල දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය එච්. ආර්. එන්. ජී. එගොඩගොඩ මහත්මියත්, මෙම අවස්ථාවේ මා ගෞරව පූර්වකව සිහිපත් කරමි.

යටියන්තොට පොදු ජනතාවට මෙන්ම වෙළඳ ප්‍රජාවට අත්‍යාවශ්‍ය අංගයක්ව තිබූ සතිපොළ පුරනැගුම ව්‍යපෘතිය යටතේ දැනට නිමා වෙමින් පවතින අතර 2017 වර්ෂයේ එම පොළ භූමිය ජනතා අයිතියට පත් කෙරෙනු ඇත. තවදුරටත් නවට පෙර පාසල සංවර්ධනය කිරීමත් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීමටත් 2017 වර්ෂයේ එම කටයුතු අවසන් කිීමට බලාපොරොත්තු වන අතර ඒ සඳහා සැලසුම් කටයුතු දැනටමත් නිම කර ඇති බැවින් 2017 වර්ෂය තුළ එම සංවර්ධන කටයුතු අවසන් කිරීමටත් අපේක්‍ෂා කරමි.

ආර්.එම්.ඒ.රත්නායක

ලේකම්

යටියන්තොට ප්‍රාදේශිය සභාව

# යටියන්තොට ප්‍රාදේශිය සභාව

## 2017 වර්ෂයේ අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය

වර්ග කිලෝමීටර් 171.99 පමණ විශාලැති 6 0711ක් පමණ වන ජනතාවකගෙන් සමන්විත යටියන්තොට ප්‍රාදේශිය සභාවට අදාල අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය මෙසේ ඉදිරිපත් කරමි.

මෙම අයවැය සකස් කිරීමේ දී සබරගමුව පළාත් පාලන අමාත්‍යංශය හා ශ්‍රී ලංකා පළාත් පාලන ඒකකයේ මගපෙන්වීමද, උපදේශනයද, බල ප්‍රදේශයේ ජනතාවගේ අදහස් ද, කාර්ය මණ්ඩලය විසින් දී ඇති තොරතුරුද, මහජන සංවිධානවල පොදු සමිති සමාගම්වල හා ප්‍රාදේශිය සභාවේ රැස්වීම් වලින් ගන්නා ලද තීරණ ද පාදක කරගෙන ඇත.

ඉදිරි වර්ෂයේ අපේක්ෂිත ආදායම් පදනම් කරගෙන ඒ ඒ වැඩසටහන් සඳහා හැකි උපරිම අන්දමින් වැය ප්‍රතිපාදන සලකා ඇති අතර, යටියන්තොට බල ප්‍රදේශයේ පොදු ජනතාවට අවංක හා ඵලදායී වූ සේවයක් කිරීමට අදාළ වන අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය මෙලෙස ඉදිරිපත් කරමි.

### පරිපාලනය

1. සභාවේ සියලුම බදු වර්ග ගැසට් මගින් ප්‍රකාශයට පත්කර නීත්‍යානුකූලව අයකර ගැනීමට නියමිතය.

2. සතිපොළ ආදායම එකතු කිරීම ඉදිරියටත් ආදායම් පරිපාලක නිලධාරීන් ලවාම කරවීමට තීරණය කරන ලදී, එය පරිභෝගික ජනතාවට මෙන්ම වෙළඳ ව්‍යාපාරිකයින්ටද තවත් පහසුවක් වනවා මෙන්ම ආදායම් මාර්ග වැඩිදියුණු කර ගැනීමට ඉවහල් වේ. සතිපොළ ගාස්තු රුපියල් 145 0000.00 ලෙස ඇස්තමේන්තු කර ඇත.

3. කාර්ය මණ්ඩල පුරප්පාඩු තනතුරු සඳහා සභා අරමුදලින් ගෙවීම් කිරීමට කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවාගෙන වඩාත් කාර්යක්‍ෂම හා ඵලදායී සේවාවක් ප්‍රාදේශවාසී ජනතාවට ඉටුකිරීමට පියවර ගෙන ඇත. විශේෂයෙන් කාබනික පොහොර ඒකකය සඳහා මෙම බඳවා ගැනීම වඩාත් ප්‍රයෝජනවත් වී ඇත.

4. ගිණුම් කටයුතු යාවත්කාලීනව සිදු වන අතර ඉදිරියේදී ඒවා තව තවත් නව පරිගණක මෘදුකාංග තාක්ෂණය යොදා ගනිමින් කලට වේලාවට, නිවැදිව ඉටු කිරීමට වගබලා ගනිමි.

5. වරිපනම්, ගිණුම් හා වැටුප් පරිගණක ගත කර ඇති අතර අනෙකුත් විෂයන්ද පරිගණක ගත කොට කාර්යාලයේ කටයුතු කාර්යක්ෂමව හා විධිමත්ව පවත්වා ගෙන යාමට අවශ්‍ය පියවර ගෙන ඇත. මේ මගින් පොදු ජනතාවට කඩිනමින් උපරිම සේවාවක් කිරීම ප්‍රධාන අරමුණයි.

6. පුස්තකාල සඳහා පරිගණක පහසුකම්ද, යටියන්තොට මහජන පුස්තකාලය සඳහාද, අන්තර්ජාල පහසුකම්ද ලබා දී මෙම පුස්තකාල ජාතික තලයට ගෙන ඒමට ක්‍රියාකර ඇති අතර ඉදිරියේ දී තවත් නවීන පහසුකම් ලබා දී වැඩි දියුණු කිරීමට පියවර ගනිමි.

7. කාර්යාලීය යාබද ගොඩනැගිල්ල ඉදිකර කාර්යාලයේ පහසුකම් තව තවත් වැඩිදියුණු කිරීමට පියවර ගනිමි.

**සේවා**

1. පුස්තකාල සඳහා අවශ්‍ය නවීන පොත්පත් ලබා ගැනීම සඳහා රුපියල් ලක්ෂ හතරක ප්‍රතිපාදන වෙන් කර ඇත. බල ප්‍රදේශයේ දුවාදරුවන්ගේ අධ්‍යපන කටයුතු වලට එය මනා පිටිවහල් වනු ඇත.

2. තරුණ ළමා වැඩිහිටි සංවර්ධන වැඩසටහන් මත්ද්‍රව්‍ය විරෝධි වැඩසටහන් වනිතාවන්ට ස්වයං රැකියා අවස්ථාවන් සඳහා වැඩමුළු පැවැත්වීම ආදී විවිධ වැඩසටහන් කිරීමට බලාපොරොත්තු වෙමි.

3. කාණු පද්ධතිය නවීකරණය කිරීමට මෙන්ම මාර්ග අළුත්වැඩියා වැනි යටිතල පහසුකම් කටයුතු සංවර්ධනය කිරීමටද අපේක්ෂා කෙරේ.

**<u>වෙනත් සේවා</u>**

**බල ප්‍රදේශයේ ජනතාවගේ උන්නතිය උදෙසා කටයුතු කිරීම සඳහා ප්‍රදේශයේ ක්‍රියාත්මක සියලුම ආයතන සමග අන්‍යෝන්‍ය සුහදත්වයක් හා එකගත්වයක් මත ප්‍රාදේශීය සභාවේ පක්ෂ ප්‍රතිපක්ෂ සියළු මන්ත්‍රීලා හා මන්ත්‍රීතුමියන්ගේ, සභාවේ ලේකම් මහත්මිය ඇතුළු කාර්ය මණ්ඩලයෙත් ඒ ඒ සේවාවන් වලට අනුයුක්ත අනෙකුත් සේවක පිරිසගේත් නොමද සහයෝගය අපේක්ෂා කරමි.**

# යටියන්තොට ප්‍රාදේශීය සභාව

# 2017 අයවැය ලේඛනය

ආදායම් වියදම් තත්ත්වය

01. ආදායම

| | | | |
|---|---|---|---|
| සභාවේ උත්පාදිත ආදායම | රුපි. | 24678711.17 | |
| ප්‍රාග්ධන අදායම් | | | |
| ආදායම් ආධාර | | | |
| වැටුප් ප්‍රතිපූර්ණ හා මන්ත්‍රී දීමනා | රුපි. | 39429436.00 | |
| පළාත් සභා ආධාර | | | |
| ණය (දේ. ණය. සං. අරමුදල) | | | |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන ආදායම | | | රුපි. 64108147.17 |

<u>වියදම්</u>

| | | | |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | රුපි. | 60322898.27 | |
| ප්‍රාග්ධන වියදම | | | |
| 1. පොත් හා උපකරණ | රුපි. | 400000.00 | |
| 2. සංවර්ධන කාර්යයන් | | | |
| ගොඩනැගිලි | රුපි. | 2650000.00 | |
| ණය ගෙවීම | රුපි. | 701262.85 | |
| පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් | | | රුපි. 64074161.12 |
| අතිරික්තය | | | රුපි. 33986.05 |

## 02. වරිපනම් බදු හා ගාස්තු පැනවීම

වරිපනම් හා අනෙකුත් බදු සම්බන්ධයෙන් විශේෂ සංශෝධනයක් සිදු නොවනු ඇත.

## 03. සමුච්චිත අරමුදල් තත්ත්වය

| | | |
|---|---|---|
| 2016 .01.01 දිනට ඉ.ගෙ.අ.ශේෂය | රුපි. | 3057347.03 |
| 2016 අයවැයෙන් බලාපොරොත්තු ඉතිරිය | රුපි. | 22641.04 |
| 2016 .01.01 දිනට ඉ.ගෙ.ආ. ශේෂය | රුපි. | 3079988.07 |
| 2017 අයවැයෙන් බලාපොරොත්තු ඉතිරිය | රුපි. | 33986.05 |
| 2017.12.31 දිනට ඉ.ගෙ.ආ. ශේෂය | රුපි. | 3113974.12 |

**04. භෞතික සම්පත් නංවාලීම**

ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මත පුරනැගුම වැඩසටහන යටතේ පොදු වෙළඳපොළ සංකීර්ණ ව්‍යාපෘතිය සාර්ථකව අවසන් වෙමින් පවතී. එමගින් සමස්ථ ප්‍රජාවගේ හා පාරිභෝගික ජනතාවට පහසුව සැලසී ඇත.

අප සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය, වර්තමානයේ සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා අතරින් ප්‍රමුඛ ස්ථානයක් අත් කර ගනිමින් බල ප්‍රදේශයේ පරිසර හා සෞඛ්‍ය ආරක්‍ෂා වන පරිදි කාබනික පොහොර නිෂ්පාදන කටයුත ද සාර්ථකව සිදුකරමින් දැවැන්ත පියවරකට අවතීර්ණ වී ඇත. එමෙන්ම යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග වැඩි දියුණු කිරීම මගින් මහජනතාවට යහපත් ප්‍රවාහන සේවාවක් ලබා දීමට කටයුතු කර ඇත.

**05. ආදායම් වර්ග වල වෙනස්කම්**

| | වැඩිවීම | අඩුවීම | වෙනස |
|---|---|---|---|
| 10. වරිපනම් බදු | 107945.01 | | 107945.01 |
| 20. කුලී | 2422760.00 | | 2422760.00 |
| 30. බලපත්‍ර ගාස්තු | 110000.00 | | 110000.00 |
| 40. සේවා සඳහා ගාස්තු | 105500 .00 | | 105500.00 |
| 50. වරෙන්තු ගාස්තු හා දඩ | | 300000.00 | 300000.00 |
| 60. වෙනත් ආදායම් | 457540.00 | | 457540.00 |
| 70. ආදායම් ආධාර | 8630946.00 | - | 8660946.00 |
| එකතුව | 11834691.01 | 300000.00 | 12134691.01 |

2016 වර්ෂයට වඩා 2017 වර්ෂයේදී ආදායම් වල විශේෂ වෙනස් වීමක් ලෙස කුලී ගාස්තු වැඩි වීම පෙන්වා දිය හැක. මෙසේ කුලී ගාස්තු ආදායම් වැඩි වීමට බලපෑ කරුණ වනුයේ පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ඉදිකරනු ලබන නව සතිපොළ තුළ 2017 වර්ෂය සඳහා හරක් මස් කඩයක් ටෙන්ඩර් කිරීමට යෝජනා වී ඇති බැවිනි. ආදායම් ආධාර වැඩි වීමට හේතු වී ඇත්තේ පළාත් සභාව මගින් අනුමත කාර්යය මණ්ඩලයට නවක තනතුරු එකතු කිරීම හේතුවෙනි.

**06. අයවැය යෝජනා**

විශේෂයෙන්ම බල ප්‍රදේශයේ සෞඛ්‍ය තත්ත්වය නංවා ලීමට හා ආරක්ෂා කිරීමට මෙවර අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කර ඇත. ඩෙංගු වැනි රෝග තත්ත්වයන් මර්දනයට , බෝ වන හා බෝ නොවන රෝග මර්දනය කිරීමට , මාතෘ හා ළමා සායන හා පෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමටද කටයුතු කර ඇත.

දිළිඳු ජනතාවට වැසිකිළි ආධාර ලබා දීම, සාහිත්‍ය මාසය , කියවීම් මාසය, ජාතික උත්සව වැනි සමාජ මෙහෙවරයන් සඳහාද ප්‍රතිපාදන වෙන් කර ඇත. ක්‍රීඩා , ළමා හා තරුණ සංවර්ධන වැඩ සටහන් ආදී ප්‍රජා වැඩ කටයුතු උදෙසා මෙවර ප්‍රතිපාදන වෙන් කර ඇත.

වීථි ලාම්පු සේවාව ලබා දීම, කාණු පද්ධතිය නවීකරණය කිරීම , නගර අලංකරණය කිරීම ආදී කටයුතු සඳහාද ප්‍රතිපාදන වෙන් කර ඇත.

සහෝදර කාර්යය මණ්ඩලයේ සහ සේවක පිරිසගේත් සහයෝගය ඇතිව සභාවේ සියළුම කටයුතු කාර්යක්ෂමවත් ඵලදායිවත් , අවංකවත් අරපිරිමැසුම් දායක ලෙසත් ඉටු කරගෙන යාමට හැකි සෑම පියවරක්ම ගැනීමට බලාපොරොත්තු වෙමි.

ආර්.එම්.ඒ. රත්නායක
ලේකම්,
යටියන්තොට ප්‍රාදේශීය සභාව

# යටියන්තොට ප්‍රාදේශීය සභාව

# පොදු සංඛ්‍යා ලේඛන තොරතුරු

පොදු තොරතුරු

| | | |
|---|---|---|
| පළාත | - | සබරගමුව |
| පරිපාලන දිස්ත්‍රික්කය | - | කෑගල්ල |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | - | යටියන්තොට |
| ජන්ද ප්‍රදේශය | - | යටියන්තොට |
| බල ප්‍රදේශයේ විශාලත්වය | - | ව.කි.මී 171.99 |
| ජනගහනය | - | 60711 |
| ලියාපදිංචි ජන්ද සංඛ්‍යාව | - | 46002 |
| මන්ත්‍රී සංඛ්‍යාව | - | |

සේවක සංඛ්‍යාව

| | | |
|---|---|---|
| අනුමත | - | 85 |
| දැනට සිටින | - | 54 |

සභාව සතු වාහන

| | | |
|---|---|---|
| ඩබල් කැබ් | - | 02 |
| රෝද හතරේ ට්‍රැක්ටරය | - | 09 |
| පාපැදි | - | 00 |
| හොන්ඩා යතුරු පැදි | - | 01 |
| අත්ට්‍රැක්ටර් ට්‍රේලර් සමග | - | 01 |
| ත්‍රීරෝද රථ | - | 01 |
| කෲ කැබ් රථ | - | 01 |
| ටිපර් | - | 01 |

සභාව සතු යන්ත්‍රෝපකරණ

| | | |
|---|---|---|
| වයිබ්‍රේටින් රෝලර් | - | 01 |
| කම්පැක්ටර් ටේලරය | - | 01 |
| රෝනියෝ යන්ත්‍ර | - | 01 |
| ෆොටෝ කොපි යන්ත්‍ර | - | 03 |
| ජල බවුසර ටේලර | - | 02 |
| ෆැක්ස් යන්ත්‍ර | - | 01 |

| | | |
|---|---|---|
| පරිගණක යන්ත්‍ර | - | 14 |
| පරිගණක ප්‍රින්ටර් | - | 04 |
| බැකෝ යන්ත්‍ර | - | 01 |
| බහුවිධ ප්‍රක්ෂේපණය (ප්‍රොජක්ටරය) | - | 02 |
| ශබ්ද විකාශන යන්ත්‍ර (හෝන් 4ක් සමග) | - | 01 |
| බොබ්කැට් යන්ත්‍රය | - | 01 |
| පොහොර හලරය | - | 01 |
| ධූමායනය | - | 01 |
| ඩිජිටල් කැමරා | - | 02 |
| විදුලි ජනක යන්ත්‍ර | - | 01 |
| තණකොළ කපන යන්ත්‍ර | - | 02 |
| ගලි බවුසරය | - | 01 |

**02. සේවා හා වත්කම්**

| | | | |
|---|---|---|---|
| මාර්ග | - තාර දැමූ | - කි.මී | 12.10 |
| | - පස් යෙදූමාර්ග | - කි.මී | 291.56 |
| | - කොන්ක්‍රීට් | - කි.මී | 22.76 |
| | - අන්තර් බැඳුම් ගල් යෙදූ මාර්ග | - කි.මී | 4.022 |

| | | |
|---|---|---|
| මාතෘ දාරක සායන | - | 13 |
| පොදු වැසිකිළි | - | 4 |
| සුසාන භූමි | - | 19 |
| ආදාහනාගාර | - | 01 |
| පොදු වෙළඳ සංකීර්ණ | - | 01 |
| පොදු වෙළඳපොල කඩ කාමර | - | 21 |
| බස් නැවතුම් පළ කඩ කාමර | - | 02 |
| කියවීම් ශාලා | - | 03 |

පුස්තකාල

ක්‍රීඩාපිටි - 01

පෙර පාසල් (සභාව සතු) - 01

පෙර පාසල් (අධාර ගෙවන) - 09

රැස්වීම් ශාලා - 01

සෞඛ්‍ය කම්කරු නිල නිවාස - දෙමහල් 01

**03 ආදායම්**

වරිපනම් බදු දේපල සංඛ්‍යාව

නිවාස හා වාණිජ්‍ය ස්ථාන - 2058

රජයේ දේපල - 50

ආගමික ස්ථාන - 15 (වරිපනම් බද්දේන් නිදහස් කර ඇත. )

**වරිපනම් බදු ප්‍රතිශතයන්**

යටියන්තොට

නාගරික - 14%

අර්ධ නාගරික - 09%

කිතුල්ගල - 10%

අක්කර බදු ගෙවන දේපල සංඛ්‍යාව - 414

| | පාඨක සංඛ්‍යාව | පොත් සංඛ්‍යාව | ශ්‍රේණිය | 2014 වර්ෂයේදී මිළදී ගත් පොත් සංඛ්‍යාව | 2014 පරිත්‍යාග වශයෙන් ලදපොත් සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|---|---|---|---|
| යටියන්තොට | 5501 | 18460 | 111 | 174 | 123 | 99189.00 |
| කිතුල්ගල | 1333 | 5435 | - | 162 | 54 | 69180.00 |
| අමනාවල | 829 | 4505 | - | 200 | 13 | 65795.00 |

| | | |
|---|---|---|
| **ව්‍යාපර බදු ගෙවන දේපල සංඛ්‍යාව** | - | 1045 |
| **වෙළඳ බලපත්‍ර ගාස්තු ගෙවන දේපල සංඛ්‍යාව** | - | 313 |
| **බදු දෙනු ලබන ඉඩම් කට්ටි** | - | 05 |
| **සතිපොලවල්** | - | 02 |

| | | |
|---|---|---|
| **මස් කඩ** | **- සභාව සතු** | - 02 |
| **මාළු කඩ** | **- සභාව සතු** | - 03 |

# යටියන්තොට ප්‍රාදේශිය සභාව මිනිස් බල සාරංශය

| අනු අංකය | තනතුර හා ශ්‍රේණිය | අනුමත | දැනට සිටින | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|---|
| 01 | ලේකම් (කළමනාකරණ සහකාර සේවයේ අධි) | 01 | 01 | - | - |
| 02 | සංවර්ධන නිලධාරී | 12 | 04 | 08 | - |
| 03 | කළමනාකරණ සහකාර සේවය 11 හා 111 ශ්‍රේණිය | 12 | 12 | - | - |
| 04 | පුස්තකාලයාධිපති 111 ශ්‍රේණිය | 01 | - | 01 | - |
| 05 | පුස්තකාල සහායක | 03 | - | 03 | - |
| 06 | කාර්මික නිලධාරි ( ශ්‍රී. ලං.තා.සේ 01) | 01 | 01 | - | - |
| 07 | කාර්මික නිලධාරි ( ශ්‍රී. ලං.තා.සේ 11) | 01 | 01 | - | - |
| 08 | ආදායම් පරිපාලක | 02 | 02 | - | - |
| 09 | වැඩ පරිපාලක | 01 | - | 01 | - |
| 10 | විදුලි කාර්මික | 01 | - | 01 | |
| 11 | කාර්යාල කාර්ය සහායක | 02 | 01 | 01 | - |
| 12 | මුරකරු | 04 | 01 | 03 | - |
| 13 | රියදුරු | 01 | 01 | 02 | - |
| 14 | ට්‍රැක්ටර් රියදුරු | 02 | | | - |
| 15 | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 17 | 15 | 02 | - |
| 16 | සෞඛ්‍ය කංකානම | 01 | - | 01 | - |
| 17 | සෞඛ්‍ය කම්කරු | 21 | 15 | 06 | - |
| 18 | ආදාහනාගාර ක්‍රියාකරු<br>ආදාහනාගාර භාරකරු | 01<br>01 | -<br>- | 01<br>01 | |
| | | 85 | 54 | 31 | - |

# අනුමැතියට යවා ඇති තනතුරු

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | රියදුරු | 03 |
| 02 | පෙර පාසැල් පාලිකා | 01 |
| 03 | බොබ් කැට් ක්‍රියාකරු | 01 |
| 04 | බැකෝ ක්‍රියාකරු | 01 |

# කාර්යාලීය සංවිධාන සටහන
# යටියන්තොට ප්‍රාදේශීය සභාව




| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍ර.ක.ස. | - ප්‍රධාන කළමනාකාර සහකාර | පුස්. (අධි) | - පුස්තකාලායාධිපති | සෞ.ක. | - සෞඛ්‍ය කම්කරු |
| ස.නි. | - සංවර්ධන නිලධාරී | පුස්.ස | - පුස්තකාල සහායක | මා.ක. | - මාර්ග කම්කරු |
| ක.ස. | - කළමනාකාර සහකාර | වි.කා | - විදුලි කාර්මික | ආදා.භා | - ආදාහනාගාර භාරකරු |
| කා.නි | - කාර්මික නිලධාරී | කා.කා.ස | - කාර්යාල කාර්ය සහායක | ආදා. ක්‍රි | - ආදාහනාගාර ක්‍රියාකරු |
| වැ.ප | - වැඩ පරිපාලක | | | | |
| ආ.ප. | - ආදායම් පරිපාලක | | | | |

## යටියන්තොට ප්‍රාදේශීය සභාව- පුනරාවර්තන ආදායම් විශ්ලේෂණය (රුපියල් දහස් වලින්)

**2015 වර්ෂයේ සත්‍යය ආදායම රුපියල් 19875.75**




**2016 වර්ෂයේ ඇස්තමේන්තු ගත ආදායම රුපියල් 52573.51**




**2017 වර්ෂයේ ඇස්තමේන්තු ගත ආදායම රුපියල් 34854.00**




| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 10 | වරිපනම් හා බදු | 3911.61 | 7.95% | 4238.91 | 8.06% | 4346.85 | 6.78% |
| 20 | කුලී | 4508.96 | 9.17% | 5117.40 | 9.73% | 7540.16 | 11.76% |
| 30 | බලපත්‍ර ගාස්තු | 849.36 | 1.73% | 810.10 | 1.54% | 920.10 | 1.44% |
| 40 | සේවා සඳහා ගාස්තු | 756.09 | 1.54% | 647.60 | 1.23% | 753.10 | 1.17% |
| 50 | වරෙන්තු ගාස්තු හා දඩ | 6631.55 | 13.48% | 4935.50 | 9.39% | 4635.50 | 7.23% |
| 60 | වෙනත් ආදායම් | 14460.83 | 29.39% | 6125.50 | 11.65% | 6583.00 | 10.27% |
| 70 | ආදායම් ආධාර | 18076.80 | 36.75% | 30698.50 | 58.39% | 39329.44 | 61.35% |
| | එකතුව | 49195.20 | 100.00% | 52573.51 | 100.00% | 64108.15 | 100.00% |

# යටියන්තොට ප්‍රාදේශීය සභාව- පුනරාවර්තන වියදම් විශ්ලේෂණය (රුපියල් දහස් වලින්)

| 2015 වර්ෂයේ සත්‍යය වියදම | 2016 වර්ෂයේ ඇස්තමේන්තු ගත | 2017 වර්ෂයේ ඇස්තමේන්තු ගත |
|---|---|---|
| රුපියල් රුපියල් 18018.71 | වියදම රුපියල් 51186.36 | වියදම රුපියල් 58927.90 |










| | | 2015 | | 2016 | | 2017 | |
|---|---|---|---|---|---|---|---|
| 1 | වැටුප් හා දීමනා | 23967.12 | 67.49% | 32079.09 | 62.67% | 41265.44 | 68.41% |
| 2 | ගමන් වියදම් | 99.90 | 0.28% | 730.00 | 1.43% | 755.00 | 1.25% |
| 3 | සැපයුම් හා උපකරණ | 2976.17 | 8.38% | 5545.00 | 10.83% | 6095.00 | 10.10% |
| 4 | ප්‍රා.වත්කම් අ/වැ හා නඩත්තු | 4125.26 | 11.62% | 4520.00 | 8.83% | 4325.00 | 7.17% |
| 5 | ප්‍රවා.සම් හා ආවශ්‍යක සේවා | 2703.73 | 7.61% | 5560.50 | 10.86% | 5737.50 | 9.51% |
| 6 | පොලී හා ලාභාංශ | 301.49 | 0.85% | 446.27 | 0.87% | 234.46 | 0.39% |
| 7 | ආධාර දායක හා සහනාධාර | 506.93 | 1.43% | 1285.50 | 2.51% | 1085.50 | 1.80% |
| 8 | වි.වැ.වි. ප්‍රතිලාභ හා පරි. | 829.36 | 2.34% | 1020.00 | 1.99% | 825.00 | 1.37% |
| | එකතුව | 35509.96 | 100% | 51186.36 | 100.00% | 60322.90 | 100.00% |

# යටියන්තොට ප්‍රාදේශීය සභාව - පුනරාවර්තන වියදම් සාරාංශය 2017

| වැය විෂයයන් | 01<br>පොදු පරිපාලනය | 02<br>සෞඛ්‍ය සේවා | 03<br>භෞතික සැලසුම් | 04<br>ජල සේවා | 05<br>උපයෝගි සේවා | 06<br>සුභ සාධක සේවා | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 01. වැටුප් හා දීමනා | 18749508.00 | 11035520.00 | 7604884.00 | 473692.00 | 833584.00 | 2568248.00 | 41265436.00 |
| 02. ගමන් වියදම් | 352500.00 | 225000.00 | 142500.00 | 10000.00 | 10000.00 | 15000.00 | 755000.00 |
| 03. සැපයුම් හා උපකරණ | 2760000.00 | 1795000.00 | 770000.00 | | 600000.00 | 170000.00 | 6095000.00 |
| 04. ප්‍රාග්ධන වත්කම් අ/වැ හා නඩත්තු | 510000.00 | 750000.00 | 2425000.00 | 150000.00 | 265000.00 | 225000.00 | 4325000.00 |
| 05. ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 3532500.00 | 1420000.00 | 100000.00 | | 250000.00 | 435000.00 | 5737500.00 |
| 06. පොලී හා ලාභාංශ | - | 234462.27 | | | | | 234462.27 |
| 07. ආධාර හා සහනාධාර | 225000.00 | 302500.00 | 5000.00 | 1000.00 | 1000.00 | 551000.00 | 1085500.00 |
| 08. වි. වැ. වි. ප්‍ර. හා පාරිතෝෂික | 275000.00 | 300000.00 | 150000.00 | | 50000.00 | 50000.00 | 825000.00 |
| මුළු පුනරාවර්තන වියදම | 26404508.00 | 16062482.27 | 11197384.00 | 634692.00 | 2009584.00 | 4014248.00 | 60322898.27 |

# යටියන්තොට ප්‍රාදේශීය සභාව - පුනරාවර්තන ආදායම් සාරාංශය 2017

| අය විෂයයන් | 01 පොදු පරිපාලනය | 02 සෞඛ්‍ය සේවා | 03 භෞතික සැලසුම් | 04 ජල සේවා | 05 උපයෝගි සේවා | 06 සුභ සාධක සේවා | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|---|
| 10. වරිපනම් හා බදු | 3686856.17 | 650000.00 | - | - | - | 10000.00 | 4346856.17 | 6.78% |
| 20. කුලී | - | 25000.00 | 471885.00 | 100000.00 | 6893270.00 | 50000.00 | 7540155.00 | 8.25% |
| 30. බලපත්‍ර ගාස්තු | 200100.00 | 720000.00 | - | - | - | - | 920100.00 | 1.44% |
| 40. සේවා සඳහා ගාස්තු | 47600.00 | 455000.00 | 235500.00 | - | - | 15000.00 | 753100.00 | 1.24% |
| 50. වරෙන්තු ගාස්තු හා දඩ | 4505500.00 | - | 5000.00 | - | 100000.00 | 25000.00 | 4635500.00 | 7.23% |
| 60. වෙනත් ආදායම් | 6080000.00 | 400000.00 | 40000.00 | - | 51000.00 | 12000.00 | 6583000.00 | 10.27% |
| 70. ආදායම් ආධාර | 18312708.00 | 10131120.00 | 7332084.00 | 394692.00 | 775584.00 | 2383248.00 | 39329436.00 | 61.35% |
| මුළු පුනරාවර්තන ආදායම | 32832764.17 | 12381120.00 | 8084469.00 | 494692.00 | 7819854.00 | 2495248.00 | 64108147.17 | 100.00% |
| මුළු පුනරාවර්තන වියදම (අඩු කළා) | 26404508.00 | 16062482.27 | 11197384.00 | 634692.00 | 2009584.00 | 4014248.00 | 60322898.27 | |
| පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම | 6428256.17 | -3681362.27 | -3112915.00 | -140000.00 | 5810270.00 | -1519000.00 | 3785248.90 | |

# වැඩසටහන් අංක 01 යටතේ ඇස්තමේන්තු කර ඇති පුනරාවර්තන ආදායම් ප්‍රභවයන් මෙසේය

## වරිපනම් - 1..11

ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාර මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් අය කිරිම කරනු ලබයි. දැනට 2010 වර්ෂයේ තක්සේරු වටිනාකම මත මෙම වරිපනම් අය කරනු ලබන අතර ඒ සඳහා මෙම සභාව විසින් දේපල වල වාර්ෂික වටිනාකම මත යටියන්තොට කොටසෙහි නාගරික 14% ක ද , අර්ධ නාගරික 9%ක ද කිතුල්ගල කොටසෙහි 10% ක් ද වශයෙන් ප්‍රතිශතයන් මත වරිපනම් ආදායම ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව හඳුනාගෙන ඇති දේපල සංඛ්‍යාව 2108 ක් වෙනුවෙන් 2017 වර්ෂයේ අපේක්ෂිත වරිපනම් වටිනාකම රුපි. 3618921.51 ක් වේ.

## අක්කර බදු 1..12

ප්‍රාදේශීය සභා පනතේ 134 (3) වගන්තිය ප්‍රකාර සභා බල ප්‍රදේශය තුල පිහිටියා වු ස්ථිර හෝ නීතිපතා ගොවිතැනක් යටතේ වු එක් එක් ඉඩම හෙක්ටයාර් මත පහත දක්වා ඇති අනුප්‍රමාණයන් නොඉක්මවන අක්කර බද්දක් අයකිරීම සඳහා වන ප්‍රතිපාදන සැලසී ඇත.
ඉඩමේ ප්‍රමාණය හෙක්ටාර් පහකට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩු වන අවස්ථාවක රු. 50 ක්ද, ඉඩමේ ප්‍රමාණය හෙකටයාර් පහක් හෝ රට වැඩිවන අවස්ථාවක රු. 10.00 ක්ද වශයෙන් අක්කර බද්දක් අයකිරිමට තීරණය කර ඇත. ඒ අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රාදේශයේ ආදායම් විෂය යටතේ හඳුනාගෙන ඇති ඉඩම් සංඛ්‍යාව 113 ක් වන අතර , එමගින් රුපි. 67434.66 ක අක්කර බදු ආදායමක් 2017 වර්ෂය වෙනුවෙන් ඇස්තමේන්තු කර ඇත.

## 1% බැගින් අයකරනු ලබන බදු 1..18

ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්තිය ප්‍රකාර සභා සිමාව ඇතුලත වු යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යයාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක හෝ ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% කට සමාන මුදලක් විකුණුම්කරු විසින් ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු යැයි සඳහන් ව ඇත. ඒ අනුව 2017 වර්ෂයේ මෙම ආදායම් විෂය යටතේ රු 500.00 ක් ඇස්තමේන්තු කර ඇත.

## වාහන බලපත්‍ර ගාස්ත්‍ර ගාස්තු) - 1.35

ප්‍රාදේශීය සභා පනතේ 147 (1) (අ) වගන්තිය ප්‍රකාර වාහන හා සතුන් පිළිබඳ බද්දක් අයකල හැකි බවට ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව එම පනතේ හතර වන උප ලේඛනය අනුව මෙසේ අය කළ යුතු වාර්ෂික බදු ප්‍රමාණයන් නියම කර ඇත.ඒ අනුව බයිසිකලයක් සඳහා අය කළ යුතු මුදල රුපි. 4.00 ක් ලෙස සඳහන් ව ඇත. පසුගිය වර්ෂ කිහිපයක මේ විෂය යටතේ එකතුවූ ආදායම සැලකිල්ලට ගෙන 2017 වසර වෙනුවෙන් මේ විෂය යටතේ රු 100.00 ක් ආදායමක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

## ප්‍රචාරක දැන්වීම් , බිත්ති , දැන්වීම් , කටවුට් හා පෝස්ටර් සඳහා ගාස්තු - 1.36

ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තිය ප්‍රකාර අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලය සභාව වෙත ඇත. ඒ අනුව ප්‍රචාරක දැන්වීම් , බිත්ති දැන්වීම් , කටවුට් හා පෝස්ටර් දැන්වීම් ආදියෙන් ගාස්තුවක් අයකිරිම සභාව විසින් ඊට අදාල අතුරු ව්‍යවස්ථා මගින් ප්‍රතිපාදන සලසා ගෙන ඇත. ඒ අනුව 2017 වර්ෂයේදී මේ සඳහා අයකරනු ලබන ගාස්තු ප්‍රමාණයන් පහතින් පළවේ. මෙම ගාස්තු ප්‍රමාණයන් පදනම් කරගෙන ප්‍රදේශයේ ප්‍රචාරක දැන්වීම්, බිත්ති දැන්වීම් , කටවුට් හා පෝස්ටර් මගින් 2017 වර්ෂයට රු 200000.00 ක ආදායමක් ඇස්තමේන්තු කර ඇත.

| | |
|---|---|
| දැන්වීම් පුවරු වර්ග අඩි 1ක් සඳහා | රු. 25.00 |
| ස්ථිර දැන්වීම් පුවරු වර්ග අඩි 1 ක් සඳහා | රු. 50.00 |

## සේවා සඳහා ගාස්තු 40

සභාව විසින් සපයනු ලබන විවිධ සේවාවන් වෙනුවෙන් ගාස්තුවක් අයකරනු ලබයි. මෙම සභාව විසින් පහත සඳහන් සේවාවන් සැපයීම වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු ප්‍රමාණයන් මෙසේය. මේ ගාස්තු ප්‍රමාණයන් 2017 වර්ෂයට ද අයකරනු ලබයි.

| | | |
|---|---|---|
| වරිපනම් සඳහා සහතික නිකුත් කිරිමට | රුපි. | 2500.00 |
| නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීමට | රුපි. | 45000.00 |
| විශේෂ ගාස්තු | රුපි. | 100.00 |

## උසාවි දඩ 1.52

ප්‍රාදේශිය සභා පනත මෙන්ම වෙනත් අණපනත් ක්‍රියාත්මක කිරීමේදී මෙන්ම නිතිය ක්‍රියාත්මක වීම තුලින් උසාවිය විසින් අයකර ගන්නා වු දඩ මුදල් වලින් ප්‍රාදේශීය සභාව වෙත ලැබේයැයි අපේක්ෂිත ආදායම උසාවි දඩ ආදායම යටතේ ඇස්තමේන්තු කර ඇත. පසුගිය වර්ෂ කීපයක ලැබි ඇති උසාවි දඩ ආදායම උපකල්පනය කරමින් මෙසේ 2017 වර්ෂය වෙනුවෙන් උසාවි දඩ යටතේ රුපි. 45 00000.00 ක් ඇස්තමේන්තු කර ඇත.

## වෙනත් ආදායම් - 6 0

ස්ථාවර තැන්පත් යටතේ අපේක්ෂිත පොලී ආදායමද, වැඩසටහන් 01 යටතේ වන ආකෘති හා පෝරම ආදිය විකිණීමෙන් ලැබෙන ආදායම ද, සභා සේවකයින් වෙනුවෙන් ලබාදී ඇති සේවක ණය පොලිය ආදායමක් ලෙස ද මේ යටතේ ඇස්තමේන්තු කර ඇත.

ස්ථාවර තැන්පත් පොලී රුපි. 200000.00

ආකෘති පත්‍ර හා පෝරම විකිණීම රුපි. 20000.00

ඊට අමතරව ප්‍රදේශයේ සංවර්ධනයත් සමග සිදුවන ඉඩම් ගනුදෙනු කිරිම තුළින් මුද්දර ගාස්තු ආදායමක් ලෙස 2017 වර්ෂයේ රු 5 800000.00 ක් ද ඇස්තමේන්තු කර ඇත. මෙම ආදායම ඇස්තමේන්තු කර ඇත්තේ පසුගිය වර්ෂ කිහිපය තුලදී මුද්දර ගාස්තු වශයෙන් ලැබී ඇති ආදායම පදනම් කරගෙනය.

## ආදායම් ආධාර- 1.70

මෙම ප්‍රාදේශීය සභාව වෙනුවෙන් අනුමත කාර්ය මණ්ඩලය 85 අතර සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය 32 කි.

2017 වර්ෂය වෙනුවෙන් පොදු පරිපාලනය වැඩ සටහනට අයත් සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු තනතුරු වෙනුවෙන්ද වැටුප් ප්‍රතිපූර්ණය වශයෙන් රුපි. 14127708.00 ක් ඇස්තමේන්තු කර ඇත.

ගරු සභාපතිතුමා ඇතුළු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමන්ලාගේ දිමනා යටතේ ප්‍රතිපුරණ ලෙස අපේක්ෂිත මුදල රපි. 4185 000.00 කි.

# යටියන්තොට ප්‍රාදේශීය සභාව
# 2017 වර්ෂය සඳහා පුනරාවර්තන ආදායම් ඇස්තමේන්තු

වැඩ සටහන් අංක 01 - පොදු පරිපාලන සේවා

| ආදායම් ශීර්ෂ යන් | ආදායම් විෂයයන් | 2014 සත්‍ය ආදායම | 2015 සත්‍ය ආදායම | 2016 අපේක්ෂිත ඇස්තමේන්තුව | 2017 අපේක්ෂිත ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| **10** | **වරිපනම් හා බදු** | | | | |
| **1.11** | වරිපනම් | 3457451.88 | 3135345.88 | 3585976.50 | 3618921.51 |
| **1.12** | අක්කර බදු | 42574.85 | 63809.33 | 67434.66 | 67434.66 |
| **1.18** | 1 බැගින්අයකරනුලබන බදු | | - | 500.00 | 500.00 |
| | **එකතුව** | **3500026.73** | **3199155.21** | **3653911.16** | **3686856.17** |
| **30** | **බලපත්‍ර ගාස්තු** | | | | |
| **1.35** | වාහන බලපත්‍ර | 92.00 | 56.00 | 100.00 | 100.00 |
| **1.36** | විශෙශ බලපත්‍ර(ප්‍රචාරක දැන්වීම් පුවරු) | 154450.00 | 136825.00 | 125000.00 | 200000.00 |
| | **එකතුව** | **154542.00** | **136881.00** | **125100.00** | **200100.00** |
| **40** | **සේවා සඳහා ගාස්තු** | | | | |
| **1.42(1)** | වරිපනම් සඳහා සහතික නිකුත කිරීමේ ගාස්තු | 1350.00 | 2300.00 | 2000.00 | 2500.00 |
| **1.43** | නොපවරා ගැනීමේසහතික සඳහා ගාස්තු | 45700.00 | 43525.00 | 4500.00 | 45000.00 |
| **1.44** | විශේෂ ගාස්තු | | | 100.00 | 100.00 |
| | **එකතුව** | **47050.00** | **45825.00** | **6600.00** | **47600.00** |
| **50** | **වරෙන්තු ගාස්තු හා දඩ** | | | | |
| **1.51** | වරෙන්තු ගාස්තු | 142644.01 | 37514.58 | 5000.00 | 5000.00 |
| **1.52** | උසාවිදඩ(පලාත් සභාවෙන්) | 4143792.00 | 6385925.00 | 4800000.00 | 4500000.00 |
| **1.59** | උසාවිදඩනොවනවෙනත්දඩ | 2827.17 | - | 500.00 | 500.00 |
| | **එකතුව** | **4289263.18** | **6423439.58** | **4805500.00** | **4505500.00** |
| **60** | **වෙනත් ආදායම්** | | | | |
| **1.61** | ස්ථාවර තැන්පත් පොලී | 148346.71 | 228595.69 | 200000.00 | 200000.00 |
| **1.62(2)** | ආකෘතිපත්‍රහාපෝරමවිකිණීම | 15429.00 | 11514.00 | 20000.00 | 20000.00 |
| **1.63** | මුද්දර ගාස්තු (පලාත් සභා) | 1326065.27 | 14013995.86 | 5500000.00 | 5800000.00 |
| **1.64** | සේවක ණය පොලී | 71933.95 | 72501.55 | 75000.00 | 60000.00 |
| | **එකතුව** | **1561774.93** | **14326607.10** | **5795000.00** | **6080000.00** |
| **70** | **ආදායම් ආධාර (ප්‍රතිපූරණ)** | | | | |
| **1.71** | කාර්ය මණ්ඩලයේ වැටුප් | 6288225.23 | 10724102.29 | 10269492.00 | 14127708.00 |
| **1.71 (2)** | සභාපති ඇතුළුමන්ත්‍රී දීමනා | 1111500.00 | 175000.00 | 3780000.00 | 4185000.00 |
| | **එකතුව** | **7399725.23** | **10899102.29** | **14049492.00** | **18312708.00** |
| | **මුළු එකතුව** | **16952382.07** | **35031010.18** | **28435603.16** | **32832764.17** |

# වැඩසටහන් අංක 01
# සාමාන්‍ය පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා පුනරාවර්තන වියදම්

මෙම වැඩසටහනට අයත් කාර්යයන් පහත සඳහන් ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක වන ලබයි.

ව්‍යාපෘති අංක 01 - පොදු පරිපාලනය

ව්‍යාපෘති අංක 02 - මූල්‍ය කටයුතු

ව්‍යාපෘති අංක 03 - තක්සේරු කිරීම් හා ආදායම් එකතු කිරීම්

ව්‍යාපෘති අංක 04 - අභ්‍යන්තර විගණනය

වයාපෘති අංක 05 - ප්‍රධාන වැඩපල

ව්‍යාපෘති අංක 06 - කාර්ය මණ්ඩල පුහුණු කිරිම

## 01. *පොදු පරිපාලනය*

මේ යටතේ සභාව වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත බලතල , කාර්ය හා යුතුකම් ක්‍රියාත්මක කිරීමේදී හා ඉටු කිරීමේදී පනවනු ලබන ප්‍රතිපත්ති හා තීරණ නිසියාකාරව අප්‍රමාදව හා අර්ථවත්ව ඉටු කරනු ලබන බවට තහවුරු කිරීමක් අපේක්ෂා කරනු ලබයි. එම අපේක්ෂාවන් මුදුන්පත් කරගැනීම සඳහා

1. සභාපති හා සභිකයින්ගේ පාලනය සඳහා ලේකම් සේවාව සැපයීම.
2. සභාවේ රැස්වීම් පිළියෙල කිරිම හා වාර්තා පවත්වා ගෙන යාම.
3. ලේඛනාගාරය පවත්වාගෙන යාම සහ සභාවේ ලිපිගොනු, වාර්තා හා වෙනත් ලිපි ලේඛන සුරක්ෂිතව තබා ගැනීම.
4. සේවක මණ්ඩලය පාලනය, විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පාලන කටයුතු
5. සභාවේ සියළුම පරිපාලනමය හා විධායක කාර්යයන් නියම කිරීම , විධිමත් කිරීම හා පරිලෝචනය කිරීම.
6. සභාවේ සැම අංශයක්ම ඒකාබද්ධ කිරීමේ ඒකකය වශයෙන් කටයුතු කිරිම.
7. ප්‍රාදේශිය සභාවේ දේපල ආරක්ෂාව හා භාරකාරත්වය නිසැක කිරීමට ක්‍රමයක් ඇති කිරිම

## 02. මූල්‍ය කටයුතු

මෙම අංශයේ ප්‍රධාන පරමාර්ථය නම් මූල්‍ය පාලනයයි. සභාවේ සියළුම මූල්‍ය කටයුතු ඉටු කිරීම , පාලනය කිරීම හා ඒකාබද්ධ කිරීම ප්‍රධානතම කාර්යය වේ. භාවිතය සඳහා අවශ්‍ය භාණ්ඩ වෙනුවෙන් තොග ගබඩා අවශ්‍ය වන්නේ නම් ඒවා පවත්වා ගෙන යාමේ හා පාලනය කිරීම් ආදි කටයුතු ඉටු කිරීම කරනු ලබයි. මේ යටතේ සිදුවන සේවාවන් මෙසේ විග්‍රහ කළ හැකිය.

1. අයවැය ලේඛනය පිළියෙල කිරීම , ක්‍රියාත්මක කිරීම හා ගිණුම් තැබීම හා ගිණුම් වාර්තා සැපයීම.
2. ආදායම් ප්‍රතිපත්ති හා මුදල් සැපයුම් පරිපාලනය කිරීම.
3. ප්‍රාදේශීය සභා අරමුදල් පාලනය කිරීම.
4. ආදායම් හා වෙනත් ලැබීම් පිළිබඳ මධ්‍යගත පාලනය.
5. ගිණුම් ගත කිරීමේ ක්‍රම, කාර්ය සංවිධානය හා පාලන ක්‍රම ගිණුම් පොත් පවත්වාගෙන යාම හා ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරීම.
6. බඩු බාහිරාදිය මිළදී ගැනීම , එහි භාරකාරත්වය, ගෙවීම, බෙදාහැරීම පිළිබඳ මධ්‍යගත පාලනය , කාර්ය මණ්ඩලය වැටුප් හා පරිශ්‍රමික දීමනා පිළියෙළ කිරීම හා ගෙවීම් කිරීම.

## 3. තක්සේරු කිරීම හා ආදායම් එකතු කිරීම

මෙම අංශයට අයත් කාර්යය නම් නිතිමය විධිවිධාන අනුව ප්‍රාදේශීය සභා ආදායම් අප්‍රමාදව හා ක්‍රමවත්ව එකතු කර ගැනිම සඳහා ගතවු සැම පියවරක්ම ගැනීමට ක්‍රියා කරනු ලබන අතර, ඒ පිළිබඳ ලිපි ලේඛන පවත්වාගෙන යාම හා සභාවට ආදායම් වැඩිදියුණු කරගන්නා මාර්ගයන් සොයා බැලීම හා අවශ්‍ය නිති සම්පාදනය කිරීම වෙනුවෙන් ක්‍රියා කරනු ඇත.

## 4. අභ්‍යන්තර විගණනය

මෙම අංශයේ කාර්යයන් නම් බදු ගෙවන්නන් සහ සභාව වෙනුවෙන් පරිපාලනයේ සෑම අංශයක්ම පිරික්සීම හා විමර්ශනයට භාජනය කිරිමයි. පහත සඳහන් කාර්යයන් මෙහි ප්‍රධාන කොට සැලකිය හැක.

1. ප්‍රාදේශීය සභාවේ අරමුදලට ලැබිය යුතු මුදල් නිසියාකාරව අය කරනු ලබන බව සොයා බැලීම.
2. වැරදි සහ වංචනික ක්‍රියා වැලැක්වීම සඳහා සියළුම ගිණුම් ඒකකයන් සම්බන්ධයෙන් කරනු ලබන අභ්‍යන්තර ගිණුම් විගණනය සාර්ථක ලෙස කිරීම.
3. භාණ්ඩ පරිහරණය සහ කම්කරු ශ්‍රමය හරිහැටි උපයෝගි කරගන්නේ දැයි සොයා බැලීම.
4. නිදැල්ලේ ඇති සභාවේ වත්කම් නොපමාව විධිමත් භාරකාරත්වය යටතට ගැනිම හා කම්කරු ශ්‍රමය හා ද්‍රව්‍ය නාස්තිය වැලැක්වීමට කටයුතු කිරිම.

## 5. ප්‍රධාන වැඩපල

ප්‍රාදේශීය සභාව සතු සියළුම වත්කම් අලුත්වැඩියා කටයුතු මෙම ව්‍යාපෘතිය මගින් ඉටු කරවා ගනු ලබයි. වාහන යන්ත්‍රසූත්‍ර මෙන්ම අනෙකුත් කාර්යාල පරිහරණය කරනු ලබන භාණ්ඩ මෙම වැඩපල මගින් අලුත්වැඩියා කටයුතු ආදිය කරගනු ලබයි.

## 6. කාර්ය මණ්ඩල පුහුණු කිරීම

උසස්ම නිලධාරියාගේ සිට පහල කම්කරුවා දක්වා සේවය කරනු ලබන සියලුම සේවකයින්ට තම කාර්යය කෙසේ කළයුතුද යන්න පිළිබඳ හා හොඳ සේවාවක් ඇති කර ගැනීමේ අදහසින් සේවක පුහුණු ඇති කිරිම මෙහි අරමුණයි. ගරු මන්ත්‍රීතුමන්ලාටද පුහුණු වැඩ මුළු සඳහා මුදල් වෙන් කර ඇත.

# යටියන්තොට ප්‍රාදේශීය සභාව
# 2017 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු

**වැඩසටහන් අංක 01 - පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා**

| වියදම් ශීර්ෂ යන් | වියදම් විෂයයන් | 2014 වර්ෂයේ සත්‍ය වියදම් | 2015 වර්ෂයේ සත්‍ය වියදම් | 2016 වර්ෂයේ අපේක්ෂිත ඇස්තමේතුව | 2017 වර්ෂයේ අපේක්ෂිත ඇස්තමේතුව |
|---|---|---|---|---|---|
| **101** | **පෞද්ගලික පඩිනඩි** | | | | |
| 101(1) | වැටුප් හා වේතන | 4662653.75 | 8442572.98 | 7274292.00 | 11132508.00 |
| 101(2) | අතිකාල හා දින වැටුප් | | 26681.61 | 150000.00 | 150000.00 |
| 101(3) | නිළ ඇඳුම් දීමනා | | 16800.00 | 28800.00 | 24800.00 |
| 101(6 ) | ජීවන අංක දීමනා | 2026134.00 | 2248568.06 | 2995200.00 | 2995200.00 |
| 101(9)1 | සභික දීමනා | 1270000.00 | 1200000.00 | 3780000.00 | 4185000.00 |
| 101(9) | වෙනත් | | | 212000.00 | |
| 101(9)3 | මුදල් පරිහරණ දීමනා | | | | 1000.00 |
| 101(9)4 | ගබඩා පරිහරණ දීමනා | | | | 1000.00 |
| 101(9)6 | පෞද්ගලික ලේකම් දීමනාව | 26750.00 | 9771.42 | | 144000.00 |
| 101(9)7 | තක්සේරුදැන්වීම්ලිවීමහා පරීක්ෂාකිරීම. | | | | 100000.00 |
| 101(9)8 | ආදායම් ලේඛන ලිවීම | | | | 10000.00 |
| 101(9)9 | ගෝ ඝතකාගාර අධීක්ෂණ දීමනාව | | | | 6000.00 |
| | **එකතුව** | **7985537.75** | **11944394.07** | **14440292.00** | **18749508.00** |
| **102** | **ගමන් වියදම්** | | | | |
| 102(1) | (ගමන් වියදම් (කාර්ය මණ්ඩල) | | 36256.50 | 302500.00 | 175000.00 |
| 102(2) | ගමන් වියදම් (ස්ථාන මාරු) | | | | 2500.00 |
| 102(3) | ගමන් වියදම් (විදේශීය) | | | | 25000.00 |
| 102(9) | ගමන් වියදම්(කාර්යමණ්ඩලයනොවන) | 1105980.00 | 11460.00 | | 150000.00 |
| | **එකතුව** | **1105980.00** | **47716.50** | **302500.00** | **352500.00** |
| **103** | **සැපයුම් හා උපකරණ** | | | | |
| 103(1) | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය උපකරණ | 647197.40 | 358066.00 | 400000.00 | 750000.00 |
| 103(2) | ඉන්ධන හා ලිහිසිතෙල් (කැබ් රථය හා ත්‍රිවිලරය සඳහා ) | 871729.52 | 794362.96 | 1250000.00 | 1200000.00 |
| 103(3) | කාර්මික හා විදුලි භාණ්ඩ | | 8534.00 | 10000.00 | 10000.00 |
| 103(6 ) | සංග්‍රහ (සභා රැස්වීම් සඳහා) | 100054.00 | 153016.00 | 200000.00 | 200000.00 |
| 103(9) | වෙනත් ගබඩා භාණ්ඩ (කැබ් රථය හා ත්‍රිවිල් රථයසඳහා ටයර් හා ටියුබ් ඇතුළුව) | 44943.00 | 95619.17 | 500000.00 | 600000.00 |
| | **එකතුව** | **1663923.92** | **1409598.13** | **2360000.00** | **2760000.00** |
| **104** | ප්‍රාග්ධන වත්කම්අළුත්වැඩියා හා නඩත්තු | | | | |
| 104(1) | වාහන යන්ත්‍රසුත්‍ර හා උපකරණ අළුත්වැඩියා කටයුතු | 85889.16 | 226678.50 | 400000.00 | 400000.00 |
| 104(2) | ගොඩනැගිලි හා වෙනත් ප්‍රාග්ධන වත්කම්අළුත්වැඩියාව හා නඩත්තුව | 9998.00 | | 50000.00 | 100000.00 |
| 104(9) | වෙනත් | 420.00 | 420.00 | 10000.00 | 10000.00 |
| | **එකතුව** | **96307.16** | **227098.50** | **460000.00** | **510000.00** |

| වියදම් ශීර්ෂ යන් | වියදම් විෂයයන් | 2014 වර්ෂයේ සත්‍ය වියදම් | 2015 වර්ෂයේ සත්‍ය වියදම් | 2016 වර්ෂයේ අපේක්ෂිත ඇස්තමේතුව | 2017 වර්ෂයේ අපේක්ෂිත ඇස්තමේතුව |
|---|---|---|---|---|---|
| **105** | **ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා** | | | | |
| 105 (1) | ප්‍රවාහනය | 15791.76 | | 20000.00 | 20000.00 |
| 105 (2)1 | දුරකථන බිල්පත් පියවීම | 303830.77 | 329903.64 | 1088000.00 | 1265000.00 |
| 105 (2)2 | මුද්දර ගාස්තු 5% (උපලේඛන සඳහා) | | 366896.25 | 400000.00 | 400000.00 |
| 105 (2)3 | වාහන රක්ෂණ ගාස්තු | 193043.35 | 299304.02 | 300000.00 | 300000.00 |
| 105 (3)1 | ජල බිල්පත් ගෙවීම | 83860.00 | 46328.95 | 75000.00 | 100000.00 |
| 105 (3)2 | විදුලි බිල්පත් ගෙවීම කාර්යාලය | 121985.26 | 82583.76 | 150000.00 | 150000.00 |
| 105 (6 ) | සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා | 4200.00 | 7840.00 | | |
| 105 (8) | මුද්‍රණ සේවා | | 2060.00 | 25000.00 | 25000.00 |
| 105 (9)1 | දේපලතක්සේරුකිරීමේනිලධාරින්ගෙවීම | 133000.00 | - | 20000.00 | 50000.00 |
| 105 (9)2 | නීතිඥ ගාස්තු (අපේක්ෂිත) | 59399.00 | - | 200000.00 | 300000.00 |
| 105 (9)3 | විගණන ගාස්තු (අපේක්ෂිත) | 464935.20 | 55724.00 | 75000.00 | 75000.00 |
| 105 (9)5 | වෙනත් | | 384508.43 | 942500.00 | 847500.00 |
| | **එකතුව** | **1380045.34** | **1575149.05** | **3295500.00** | **3532500.00** |
| **107** | **ආධාර මුදල්/දායක මුදල්/සහනාධාර** | | | | |
| 107(1) | සහනාධාර | | - | 200000.00 | 200000.00 |
| 107(2) | සුභ සාධක ගෙවීම් (නි. දුම්රිය බලපත්‍ර සඳහා) | | | 10000.00 | 10000.00 |
| 107(7) | ප්‍රදාන හා හිනි රක්ෂණ | | | - | |
| 107(9) | වෙනත් | 6000.00 | | 15000.00 | 15000.00 |
| | **එකතුව** | **6000.00** | | **225000.00** | **225000.00** |
| **108** | **විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ** | | | | |
| 108(5 ) | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායකමුදල් | 3210.00 | 157222.73 | 125000.00 | 125000.00 |
| 108(6 ) | සේවානියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් ගෙවීම | 802.50 | 23681.14 | 50000.00 | |
| 108(8) | වැන්දඹු අනන්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවීම | 92086.59 | | 150000.00 | 150000.00 |
| | **එකතුව** | **96099.09** | **180903.87** | **325000.00** | **275000.00** |
| | **මුළු එකතුව** | **12333893.26** | **15384860.12** | **21408292.00** | **26404508.00** |

# වැඩසටහන් අංක 02 යටතේ ඇස්තමේන්තු කර ඇති පුනරාවර්තන ආදායම් ප්‍රභවයන් මෙසේය.

## කර්මාන්ත බදු/ ව්‍යාපාර බදු/ වෘත්තීය බදු -2.16

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 (1) වගන්ති ප්‍රකාර සභා සීමාව තුල පවත්වාගන යනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් බද්දක් නියම කර අයකිරීම කල හැකි බවත් ඒ අනුව එම බද්ද පහත සඳහන් පරිදි අයකල හැකි බවට දන්වා ඇත.

එම කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.750.00 නොඉක්මවන අවස්ථාවක එකී ස්ථානයෙන් රු. 500.00 ක බද්දක් ද රු. 750/= ඉක්මවන එහෙත් රු. 1500/= නොඉක්මවන අවස්ථාවකදී රු. 750/= ක බද්දක් ද , රු. 1500/= ඉක්මවන අවස්ථාවක රු. 1000/= ක බද්දක් ද අය කිරීමට පනතේ විධි විධාන සලසා ඇත. ඒ අනුව එම බදු මුදල් 2017 වර්ෂය වෙනුවෙන් රුපි. 650000.00 අයකිරීමට ඇස්තමේන්තු කර ඇත.

ප්‍රාදේශීය සභා පනතේ 152 (1) සහ (2) වගන්තිය ප්‍රකාර යම් වෙළඳ ව්‍යාපාරයක් සභා සීමාව ඇතුලත පවත්වාගෙන යනු ලබන්නේ නම් එකී වෙළඳ ව්‍යාපාරයේ බද්ද ගෙවිය යුතු වර්ෂයට පෙර වර්ෂය සඳහා වු වෙළඳ ව්‍යාපාරයේ ආදායම අනුව පහත සඳහන් අනුප්‍රමාණයන් අනුව අයකර ගැනීමට 2017 වර්ෂයේදී ඇස්තමේන්තු කර ඇත.

1. වර්ෂය සඳහා වු ව්‍යාපාරයේ ආදායම රු. 6000/= නොඉක්මවෙන අවස්ථාවක කිසිදු බදු මුදලක් අය කිරීමක් නැත.
2. රු. 6000/= ඉක්මවන එහෙත් රු. 12000/= නොඉක්මවන අවස්ථාවක රු.90/= බද්දක් ද,
3. රු. 12000/= ඉක්මවන එහෙත් රු. 18750/= නොඉක්මවන අවස්ථාවක රු.180/= ක බද්දක්ද
4. රු. 18750/= ඉක්මවන එහෙත් රු. 75000/= නොඉක්මවන අවස්ථාවක රු.360/= බද්දක්ද,
5. රු. 75000/= ඉක්මවන එහෙත් රු. 150000/= නොඉක්මවන අවස්ථාවක රු.1200/= ක බද්දක්ද,
6. රු. 150000/= ඉක්මවන අවස්ථාවක රු. 3000/= ක බද්දක් ද අය කරනු ලබයි.

මේ අනුව දැනට සභාව විසින් හඳුනාගෙන ඇති ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක වන කර්මාන්ත බදු /ව්‍යාපාර බදු/ වෘත්තිය බදු අය කරනු ලබන ස්ථානයන් පිළිබඳ තොරතුරු මෙසේය.

1. ඇඳුම් මැසීමේ ස්ථානයක්
2. කුෂන් වැඩපළක් පවත්වාගෙන යාම
3. ස්වර්ණාභරණ නිෂ්පාදනය හා විකිණීම
4. විදුරු අල්මාරි නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම
5. හඳුන්කූරු නිෂ්පාදනය
6. කෘතාම මල් සෑදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
7. මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
8. ගඩොල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
9. මිනිරන් පතලක් පවත්වාගෙන යාම සහ තලාතු මිනිරන් සකස් කිරිම
10. වඩු කරමාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
11. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය
12. තීන්ත වරග නිෂ්පාදනය
13. ්සම්භාණ්ඩ නිෂ්පාදනය
14. යකඩ පුටු නිෂ්පාදනය
15. තේ කරමාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
16. රබර් කරමාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
17. යන්ත්‍ර නොමැතිව පාවහන් නිපදවීම
18. වේවැල් පුටු නිපදවීමේ ගබඩා කාරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
19. අභ්‍යාස පොත් නිෂ්පාදනය හා අලෙවිය

## <u>වෙළඳ බලපත්‍ර ගාස්තු - 2.31</u>

ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාර සහ සාදන ලද අතුරු ව්‍යවස්ථා වල විස්තර කර ඇති පරිදි ප්‍රාදේශීය සභාවේ බලපත්‍රයක් එකී ව්‍යාපාර ස්ථාන වෙනුවෙන් ලබා ගත යුතු අතර, ඒ සඳහා ගාස්තුව පහත සඳහන් පරිදි තීරණය කරනු ඇත.

1. බලපත්‍රයක් ලබාගත යුතු ව්‍යාපාර ස්ථානයේ වාර්ෂික වටිනාකම.
2. ඒ වෙළඳ ව්‍යාපාරයේ පිරිවැටුම.
3. ඒ වෙළඳ ව්‍යාපාරයෙන් උපයනු ලැබිය හැකි ලාභය.

4. ඒ වෙළඳ ව්‍යාපාරය මගින් සපයනු ලබන බඩුවල හෝ සේවාවල අත්‍යාවශ්‍ය ස්වභාවය සැලකිල්ලට ගෙන සභාව විසින් තීරණය කර ඇත. ඒ අනුව පහත සඳහන් ගාස්තු ක්‍රමය 2017 වර්ෂය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට නියමිතය. වෙළඳ ව්‍යාපාර ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750/= නොඉක්මවන අවස්ථාවක රු. 500/= ක ගාස්තුවක්,
රු. 750/= ඉක්මවන එහෙත් රු. 1500/= නොඉක්මවන අවස්ථාවක රු. 750/= ක ගාස්තුවක් ද,
රු. 1500/= ඉක්මවන අවස්ථාවක රු. 1000/= ක ගාස්තුවක්ද වශයෙනි.

ඒ අනුව 2017 වර්ෂය වෙනුවෙන් මෙසේ බලපත්‍රයත් ලබා ගත යුතු ස්ථාන පිළිබඳ මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හඳුනාගෙන ඇති ස්ථාන මෙසේය.

<u>අන්තරාදායක ව්‍යාපාර</u>

1. කම්මලක් පවත්වාගෙන යාම
2. හිස් බෝතල් ගෝනි පරණ යකඩ ගබඩා කිරීම හා විකිණීම
3 වැල්ඩින් වැඩපළක් පවත්වාගෙන යාම
4. අශ්වබල10ට අඩු වී මෝලක් පවත්වාගෙන යාම
5. ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම
6. යතුරුපැදි ත්‍රිරෝද රථ අලුත් වැඩියාව
7. මෝටර රථ අලුත් වැඩියා කිරීම
8. පා පැදි අලුත්වැඩියාව හා ටයර් ටියුබ් වෝල්කනයිසිං කිරීම
9. වැලි ගොඩ දැමීමේ හා ගබඩාකර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
10. පොහොර හෝ රසායනික පොහොර ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
11.කෘෂි රසායනික ද්‍රව්‍ය විකිණීම සදහා ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම්
12. පෙට්‍රල් ඩීසල් ලිහිසි තෙල් හෝ වෙනත් ඛනිජ තෙල් විකිණීම සදහා ගබඩාකරන ස්ථානයක් පවත්වාගෙන යාම
13. අත්‍යන්ත්‍ර මගින් රබර් ෂීට් නිෂ්නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම
14. පරිගණක යන්ත්‍ර ජංගම දුරකථන ගෘහස්ත දුරකථන අලුත්වැඩියා කිරීම
15.වාහන ස්ටිකර් සැකසීම සවකිරීම හා නාමපුවරුසැකසීම හා සව කිරීම
16.කොන්ඩා සැකසීමේ සැලුන්හල් හා බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම

අප්‍රසන්න ව්‍යාපාර

01.සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි නොකළ සංචාරක නිවාසයක් හෝ හෝටලයක් පවත්වා ගෙන යාම

02.දර මඩුවක් පවත්වාගෙන යාම

03.ලැගුම්හලක් හෝ නැවතුම්පලක් පවත්වාගෙන යාම

04.බත්කඩ ආපනශාලා හා තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම

05 .කරවළ වෙළදාම

06 මිරිස් තුනපහ ඇඹරුම් ස්ථානයක් පවත්වාගෙන යාම

07.එළවළු පළතුරු වෙළදාම

08.කිරිපට්ටියක් පවත්වා ගෙන යාම

09.මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

10.සත්ව ගොවිපළක් පවත්වාගෙන යාම

11ශීත කළ ඌරුමස් විකිණීම

12.බේකරියක් පවත්වාගෙන යාම

13.මාළු විකිණීම සදහා බක්කියක් පවත්වාගෙන යාම

14කුකුල් ගොවිපලක් පවත්වාගෙන යාම

15 .කොප්පරා වේලීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

16 .ලොන්ඩරියක් පවත්වාගෙන යාම

17.පළතුරු බීම නිෂ්පාදනය ගබඩා කිරිම හා විකිණීම

18.ඉටිපහන් නිෂ්පාදනය

19.කිරි වෙළදාම

20.යෝගට් අයිස් පැකට් නිෂ්පාදනය

21.සිගරට් ඒජන්සියක් පවත්වාගෙන යාම

22.දන්ත රසායනාගාරයක් පවත්වාගෙන යාම

23.කිරි මුදවා සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

24.රස කැවිලි නිෂ්පාදනය

25 .තෙල් සිදින ස්ථානයක් පවත්වාගෙන යාම

26 .සිසිල් බීමහලක් පවත්වාගෙන යාම

27.අයිස් ක්‍රීම්හලක් පවත්වාගෙන යාම

28.පපඩම් නිෂ්පාදනය

29.බීඩිසුරුට්ටු නිෂ්පාදනය හා වෙළදාම

30.වෙළදාම සදහා සත්ව ආහාර ගබඩාකිරිම

31.බිත්තර වෙළදාම

32.ජංගම බේකරි නිෂ්පාදන අලෙවි කිරීම

33.පිළිගත් නිෂ්පාදන ආයතන මගින්සෞඛ්‍ය ආරක්ෂිතව ඇසුරුම්කළ ශීතකළ කුකුල් මස් හා මාළු විකිණීම

34.අත්යන්ත්‍ර මගින් රබර් සැකසීම

35.විසිතුරු මසුන් විකිණීම

36.බිම්මල් නිෂ්පාදනය

<u>අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර</u>

01.බැටරි චාජ් කිරීම හා අළුත්වැඩියා කිරීම

02.බ්ලොක්ගල් වැඩපලක් පවත්වාගෙන යාම

03.විකිණීම සඳහා කළුගල් කැඩීම හා ගල්වලක් පවත්වාගෙන යාම

04.විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

05.මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

06.ජංගම මුහුදු මාළු වෙළදාම

07.තීන්ත වර්ග අලෙවය

08.ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම

09.ඔර්ලෝසු ගුවන් විදුලි යන්ත්‍ර රූපවාහිණී යන්ත්‍රශීතකරණ අළුත්වැඩියා කිරීම

10.ඉරන ලද ලී ගබඩා කිරීම හා විකිණීම

11.හුණු සිමෙන්ති ගබඩා කිරීම හා විකිණීම

12.යකඩ බඩු ගබඩාවකි පවත්වාගෙන යාම

13.පින්තූර රාමු කිරීම වීදුරු කැපීම විකිණීම හා ගබඩා කිරීම

14.යකඩ බඩු උළුඇස්බැස්ටස් ගොඩනැගිලි ද්‍රව්‍ය ගබඩා කිරීම හා විකිණීම

15.කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

16.ගෑස් සිලින්ඩර විකිණීම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

17.වළං තැනීමේ හා ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

18.කුළුබඩු පැකට් කිරීම නිල් සාම්බ්‍රානි කසාය පැකට් කිරීම

19.ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම

20.ඉංග්‍රීසි බෙහෙත් වෙළද සැලක් පවත්වාගෙන යාම

21.කොහු මෝලක් පවත්වාගෙන යාම

22.යන්ත්‍රයක් නොමැතිව නිපදවනු ලැබූ පාවහන් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

23.ත්‍රීරෝද යතුරුපැදි අමතර කොටස් අලෙවිය

24.මල් ශාලාවක් පවතිවාගෙන යාම

25.ජංගම වෙළදාම

26.ජංගම රථ මගින් රසකැවිලි වඩේ වැනි ආහාර වර්ග අලෙවිය

27.ඉහත උප ලේඛණයේ වර්ග නොකළ බලපත්‍ර දීමට සුදුසු වෙනත් ව්‍යාපාර වෙළදාම්

28.ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම

29.පත්තර සගරා පාසැල් උපකරණ විකිණීම

30.ලුණු පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.

31.ජැම් නිෂ්පැාදනය හා විකිණීම

32.ශබ්ද විකාශණ යන්ත කුලියට දීම

33.එක් දින සේල් පොලක් හෝ වෙන්දේසායක් පවත්වාගෙන යාම

## පාරිසරික බලපත්‍ර ගාස්තු -2.36

පාරිසරික පනත ක්‍රියාත්මක වීම යටතේ අය කරනු ලබන බල පත්‍ර ආදායම මේ යටතේ ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව 2017 වෙනුවෙන් රු. 120000.00 ක් ඇස්තමේන්තු කර ඇත.

## ආදාහනාගාර ගාස්තු -2.41

මෙම සභාව විසින් සේවාවක් වශයෙන් පවත්වාගෙන ගෙන යනු ලබන ආදාහනාගාරය සම්බන්ධයෙන් 2017 වර්ෂය තුළදී අය කරනු ලබන ගාස්තු ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු මෙසේය. ඒ අනුව 2017 වර්ෂය තුළ මෙම සේවාව යටතේ ආදායමක් ලෙස රුපි. 35 0000.00 ක් ඇස්තමේන්තු කර ඇත.

## කසළ ඉවත් කිරීම සඳහා ගාස්තු - 2.42

කසළ ඉවත් කිරීම සඳහා අපගේ සේවාවන් ඉල්ලා ඇති කර්මාන්ත ශාලා වල කසළ ඉවත් කිරීම සඳහා ගාස්තු වශයෙන් රුපි. 5 000.00 ක් ආදායමක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

## වෙනත් ආදායම් - 2.6 2 (3)

මෙම සභාව විසින් දැනට ක්‍රියාත්මක කරනු ලබන පොහොර අලෙවියෙන් ලැබෙන ආදායම මේ යටතේ රු. 400000.00 ක මුදලක් ඇස්තමේන්තු කර ඇත. එමෙන්ම ප්‍රදේශයේ ග්‍රාම සේවා වසම් 32 හිම කාබනික පෙහොර අලෙවිසැල බැගින් ආරම්භ කර පොහොර අලෙවිය වැඩි කර ගැනීමට සැලසුම් කර ඇත.

## ආදායම් ආධාර- 2.71

2016 වර්ෂය වෙනුවෙන් සෞඛ්‍ය සේවා වැඩ සටහනට අයත් සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය හා අනුමැතියට යවා ඇති කාර්ය මණ්ඩලය වෙනුවෙන් වැටුප් ප්‍රතිපූර්ණය වශයෙන් රුපි. 10131120.00 ක් ඇස්තමේන්තු කර ඇත.

# යටියන්තොට ප්‍රාදේශීය සභාව
# 2017 වර්ෂය සඳහා පුනරාවර්තන ආදායම් ඇස්තමේන්තු

**වැඩ සටහන් අංක 02 - සෞඛ්‍ය සේවා**

| ආදායම් ශීර්ෂයන් | ආදායම් විෂයයන් | 2014 වර්ෂයේ සත්‍ය ආදායම | 2015 වර්ෂයේ සත්‍ය ආදායම | 2016 වර්ෂයේ අපේක්ෂිත ඇස්තමේන්තුව | 2017 වර්ෂයේ අපේක්ෂිත ඇස්තමේන්තුව |
|---|---|---|---|---|---|
| **10** | **වරිපනම් හා බදු** | | | | |
| **2.16** | කර්මාන්ත බදු/ව්‍යාපාර බදු | 624000.00 | 712450.00 | 580000.00 | 650000.00 |
| | **එකතුව** | **624000.00** | **712450.00** | **580000.00** | **650000.00** |
| **20** | **කුලී** | | | | |
| **2.25** | වාහන කුලියට දීම | 72600.00 | 42800.00 | 100000.00 | 25000.00 |
| | **එකතුව** | **72600.00** | **42800.00** | **100000.00** | **25000.00** |
| **30** | **බලපත්‍ර ගාස්තු** | | | | |
| **2.31** | වෙළඳ බලපත්‍ර ගාස්තු | 508357.05 | 575026.98 | 640000.00 | 600000.00 |
| **2.36** | පාරිසරික බලපත්‍ර ගාස්තු | 95350.00 | 137450.00 | 45000.00 | 120000.00 |
| | **එකතුව** | **603707.05** | **712476.98** | **685000.00** | **720000.00** |
| **40** | **සේවා සඳහා ගාස්තු** | | | | |
| **2.41** | ආදාහනාගාර සේවා ගාස්තු | | 379500.00 | 300000.00 | 350000.00 |
| **2.42** | කසළ ඉවත් කිරීම සඳහා ගාස්තු | | | 5000.00 | 5000.00 |
| **2.44** | සේවා සඳහා ගාස්තු | 31238.25 | 28984.25 | 50000.00 | 100000.00 |
| | **එකතුව** | **31238.25** | **408484.25** | **355000.00** | **455000.00** |
